ගායකයා	බිම්බරක් සෙනඟ ගැවසුන චන්ද්‍ර සූර්යයා ඉපදුන ස්වර්ණ භූමියේ මනරම් මාළිගාව කෝ ?
පිරිස	යුද්දෙකට ඇවිත් රුපුසෙන් සත් මුහුදු මතින් ගුවණින් කම්බි වට කළේ මනරම් මාළිගාව දෝ?
ගායකයා	ට්‍රැක්ටරේ යකඩ ගජසෙන් කුංච නාදයෙන් ඇලලුන වෘක්ෂ දේවතාවන් බිම වැටී පණ ගසයි
පිරිස	මිනී මල් පිපුණ සීතල නිම්න භූමියේ ඇටකටු හතර රියන් කඩ අහිමිව විලාපය නගයි
ගායකයා	කැලෑ මල් පිපී රතු තොල් වලින් කෑ ගසා ඉල්ලන ජාතියේ නිධානය රන් රුවන් කරඬු කොයි?
පිරිස	වෑ කන්ද කඩා බිම් කටු කම්බියෙන් බෙදා මේ රණ බිමේ හිස ගසා දමනා කඩුව බිම දමව් ඉ

තවත් නව ක්‍රිස්තු වර්ෂයක උදාව ඉ උදාවන්නේ කුමක වර්ෂයක් වුවද දින ගණිනා හිරුත්, පෝහොය ගණිනා සඳුත් සමග මේ යන ගමනේ සියළු මතකයන් අතීතයට එක්වීමයි අවසන් පළය. රටක දැයක චෛතිහාසික වර්තාකමින් යුත් ගීයක පසුබිම විමසා බැලීම කාලීන වනුයේ ඒ හේතුව නිසාම නොවේ. කෙළ ගී සාහිත්‍යයේ එවන් ගී නිර්මාණය වන්නේ ඉතා විරළව විමයි අනික් හේතුව. ගීය පිළිබඳව එහි පද පෙළ ගැන්වූ රත්න ශ්‍රී විජේසිංහ වියතාණන් හා දොඩඩුළු වන්නට ''සන්නසේ'' අපි වරම් ලැබීය. ''සන්නස''

එක්දහස් නවසිය අසූ දෙකේ මට මොණරාගලට ස්ථාන මාරුවක් ලැබුණා. මම ඒ වෙනකොට ගුරුවරයෙක්. '' රත්න ශ්‍රී සිය හඬ අවදි කළා.'

''මට මොණරාගල අවුරුදු හතරක්ම වැඩ කරන්න වුණා. ඒ කාලයේ තරයි ඔය පැල්වත්ත සීනි කර්මාන්ත ශාලාව පිහිටුවන්නයි ඒකට ඕන කරන උක් වවන්නයි ගම්මුන්ගේ ඉඩම් පවරා ගන්න වැඩ කටයුතු කෙරුණේ. ඉර හඳ අතරේම සැඟවෙන්නට අර අඳින අතීතයක් පද පෙළක ගොනු කරන්නට වස්තු වූ මූල බීජය ඉපදුණ අන්දමයි මේ කියැවෙන්නේ.

''ගම්මු - විශේෂයෙන්ම ගොවියෝ මේකට විරුද්ධව නැගී හිටියා'' ඒ අයට තමන්ගේ හේන - කුඹුර, හරක - බාන, ඉන්න පැල, ගහකොල රැදුණ මහ පොළව රත්තරන් බිමක් ඉ'' දවසක් මම ඉස්කෝලෙ ඇරිලා එනකොට ''සමස්ත ලංකා ගොවි සම්මේලනයේ විරෝධතාවයක් පැවැත්වෙනවා ඉඩම් පවරා ගැනීමට විරුද්ධව. මමත් ඉතින් එතන වාඩි වුණා ඒකට සහයෝගයටත් එක්ක. ඒ ඉන්න අතරෙදි මට නිකමට වගෙ මතක් වුණා කාලාන්තරයකට ඉස්සර මේ භූමියේම සිද්ධ වුණ ඉතිහාසගත සිද්ධියක් නේද ආයෙත් සිද්ධ වෙන්නේ කියලා.''

ඒ චෛතිහාසික සිද්ධිය පිළිබඳව අප වඩාත් උනන්දු වූයේ ඒ පිළිබඳව වඩාත් දැනුවත් වීමටයි. සැබැවින්ම එයද පද මාලාවේ අන්තර්ගත වූවක්.

''මේ ප්‍රදේශය ඒ කාලෙ ඉඳලම හැදින්නුවෙ 'වෙල්ලස්ස' කියලා. දහඅටේ කැරැල්ල කියලා කියන්නේ මේ වෙල්ලස්සේ එක්දහස් අටසිය දහඅටේදී ඒ කාලයේ උන්න යටත් විජිතවාදීන්ට විරුද්ධව අපේ අය කරපු කැරැල්ල. ඒ කැරැල්ලට හේතුව වුණේ මුඩු බිම් පනත. ඒ කාලයේ පාලනය කළ සුදු ජාතියින් අතින් වෙල්ලස්සේ සිංහලයෝ තිස්දාහක් විතර මැරුම් කෑවා. ඉතිරි අය කුඹුක්කන් ඔයෙන් පහළට බැහැලා පානම් පත්තුවේ හැංගිලා ජීවත් වුණා. කලු සුද්දන්ගේ පාවාදීම් වලට බයේ තමන්ගේ නම්, වාසකම් පවා වෙනස් කර ගෙනයි මේ අය වහන් වෙලා උන්නේ.''

'' මේ ආයෙමත් වෙන්නේ ඒ දේම නේද කියලා මගෙ හිතට ආව සිතුවිල්ල තමයි මේ විදියට ලියැවුණේ. ඒ සබරගමුවේ සමන් දේවාලය ගැන කියවෙන ජන කවියක් තියෙනව මෙහෙම.

කන්ද උඩින් බැස්ස කලට පෙනේ ය උළු මාළිගාව

වෙල්ලස්සේ ගීතය

බිම්බරකුත් සෙනඟ ඇවිත් රුවට කරපු මාළිගාව
උදේ හවා දිස්නෙ දිදී රන් කොත් බබලන සොබාව
ලංකාවට තිලකයක් ය සබරගමුව මාළිගාව

මේ භාෂා රීතිය තමයි මම ගීය ලියනකොට අනුගමනය කළේ. අපේ ජනකවි වල එන හටන් කවියක් තියෙනවනේ ''යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැවී නැගිලා.....'' කියලා මේ පද මාලාවේ ආකෘතිය කර ගත්තේ ඒ හටන් කවිවල ආකෘතිය.''

වචනයේ රිසමාප්තාර්ථයෙන්ම කවියකු වූ රත්න ශ්‍රී තමන් ඇසූ පිරූ දේ පරිහරණය කරමින් කළ නව නිර්මාණයකට හොඳම නිදසුනක් නොවේ ද මේ? අවංකවම නිහතමානී ලෙස තමා ඇසුරු කළ සම්පත් හා ඒවා සැපයූ ජන කවියා පිළිබඳව සිහිපත් කිරීම පිරිපුන් බවේ ලක්ෂණයක් නොවන්නේද?

''ජන කවියේ කියවුණ සබරගමුවේ මාළිගාව ඒ කියන්නේ සමන් දේවාලය මම සංකල්ප රූපයක් විදියට ගත්තා ගැමියන්ගේ මුලු සේසතම හඳුන්වන්න. කලින් කිව්වා වගේ ස්වභාව ධර්මයේ ආශ්‍රිවාදය ඇති පොළව රන් බිමක්. විදේශ රට වලින් මුහුදු මතින්, ගුවනින් ආ ආගන්තුකයින් එදාත් අදත් කළේ ඒ රත්තරන් පොළව, ගම්මුන්ට අයිති ජාති දේපල කටු කම්බි ගහල වෙන් කරලා පවරා ගත්ත එක. කැලෑ එළිකරලා පොළම සමතලා කරන කොට එදා වෙල්ලස්ස කැරැල්ලේදී ජීවිතය පූජා කරපු සිංහලයන්ගේ ඇටකටුවලට තමන්ට හිමි වෙලා තිබුණ හතර රියනත් දිග ඇති සොහොන් පවා නැතිවෙලා ගියා.''

කැලෑ හෙළි කිරීමට යොදාගත් යන්ත්‍ර සූත්‍ර පිළිබඳව ලිව්මේදී ''ට්‍රැක්ටරේ'' වැනි ඉංග්‍රීසි වචනයක් කිසිදු පැකිලීමකින් තොරව ගීයකට යොදා ඇත්තේ නිසදැස් කාව්‍යයන් හිදී කවියා භුක්ති විඳින නිදහස උපරිම වශයෙන් ලබා ගනිමින් නොවේද? විදේශික සමාගම් දැනවීමට ගත් උත්සාහයක්ද? යන්ත්‍රවල ඝෝෂාව ඇත් රෑනක කුංච නාදයන්ට උපමා කොට ගන්නේ ආදි කාලයේ දී වූ සිදුවීම් හා සසඳන්නවද?

නැවුම් යමක් කිරීමට අර අඳින අංකුර රචකයින්ට කළිම පූර්වාදර්ශයක් නොවේද මේ? ගස්වැල් දේවත්වයෙන් ගැමියා සැලකුවේ පරිසරය හා බද්ධව ගෙන ගියා වූ ජීවන රටාවන්ට ඉන් ලැබුණා වූ පිටුවහල නිසාය. එවන් වෘක්ෂ දේවතාවන් බිම වැටී පණ ගසයි ඉ මොනයම්ම හෝ සත්ත්වයකු පණ ගසන දසුන මොනතරම් සෝචනීයද? මිනී මල් පිපුණ සීතල නිම්නය යනුවෙන් කියැවෙන්නේ ඒ මහා මිනිස් ඝාතනය සිදුවූ වෙල්ලස්ස ප්‍රදේශයයි.

රතු තොල් සේ කැලෑ මල් පිපී කෑ ගසා ඉල්ලන ජාතියේ නිධානය, රන්, රුවන් කරඬු කොහෝදායි විමසන්නේ ජාතියේ නිධානය සේ සැළකෙන මිනිස් සම්පත, මිනිස්කම වැනිදේත් රන්, රුවන් කරඬු සේ සැළකිය හැකි සමාජහර පද්ධතීන් සහ අපේ උරුමයන් පිළිබඳ නොවේද?

''වෙල්ලස්ස කියන්නේ වැව් වලින්ම පිරුණ ප්‍රදේශයක්. අඟුනකොළ පලැස්සේම වැව් සිය ගණනක් තිබුණා. මේ වැව් බැම කඩලා බිඳලා දමලයි වැව් මැදින් පාරවල් දැම්මේ. කරපු අපරාධය ගැන තවත් කියන්න ඕන නෑ නේද?'' රත්න ශ්‍රී හැඟීම් බරව අසයි.

''මේ ගීයට සංගීතය යොදලා ගායනා කළේ කපුගේ මහත්තයා. සබරගමුව ගැටුම්වලට යොදන පහත රට බෙරය යොදා ගන්න කපුගේ ගත්ත තීරණය ගීය සාර්ථක වෙන්න සෑහෙන්න බලපෑවා.'' කටු කම්බියෙන් මේ රණබිම බෙදා එහි හිස ගසා දමන කඩුව බිම දමව් ඉ පදයෙන් කියවෙන අර්ථයට බෙර පදය හොඳ හයියක් වුණා. බිම් බෙදා අපේ දේ වනසන විදේශ බලවේග විනාශ කරව්.'' යන්නයි ඉන් අදහස් වූයේ.

විශාරද ගුණදාස කපුගේ ශිල්පියාණන් පිළිබඳව අමුතුවෙන් යමක් කිව යුතු නොවේ. ඉතාම ගැඹුරු හඬකින් හැඟීම් බරව ගායනාවේ උපරිම පුරුව එදා හළ එතුමන්ගේ වියෝවය රසිකයන්ට කියා හිමකළ නොහැකි පාඩුවකි. සිතාරය, වයලීන සහ බටනලා හඬට අමතරව, එළිරිව නැගී සිටින වීරු පිරිසකගේ කාහල නාදය හැඟුම් ගැන්වීමට යෙදූ ගායන වෘන්දයේ සමූහ ගායනාවන් ගීයේ වීරෝඩුව හැඟීම් වඩාත් උද්දීපනය කරවයි. තම සිතැඟියාවන්ටම ගැලපෙන සේ ලියැවුණ හර බර මෙන්ම, චෛතිහාසික වර්තාකමකින් ද යුත් මෙම වීරල පද රචනාව වඩාත් අර්ථාන්විත කරවීමට සිය උපරිම දායකත්වය පුදා ඇති ගුණදාස කපුගේ විශාරදයන්ට සහ ''සන්නස'' සමග ළබැඳියාවෙන් එක්ව අත්වැල බැඳ සිටින සුභ වර්තමාන කවියේ යුග පුරුෂයාණන් වන රත්න ශ්‍රී විජේසිංහ නිවිදාණන්ට පාඨක සැම වෙනුවෙන් කෘතවේදිත්වය පුදමින් නව වසරේ පළමු වන 'ගී සඳළුව' මෙසේ නිමා වේ. ■